## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ (MT -01-2016) තාක්ෂණ සහායක තනතුර සඳහා සීමිත පදනමින් බඳවාගැනීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ (MT- 01-2016) තාක්ෂණ සහායක තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **බඳවා ගැනීමේ ක්‍රමය** - රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ. වෘත්තීය පරීක්ෂණය පැවැත්වෙන දිනය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

| **විෂයයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| එක් එක් තනතුරට අදාළව අපේක්ෂකයින්ගේ වෘත්තීය දැනුම හා ප්‍රායෝගික කුසලතාවන් මැන බැලීම | 100 | 40 |

2. **පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව -**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ (MT- 01-2016) තාක්ෂණ සහායක තනතුර සඳහා පුරප්පාඩු 03 ක් පිරවීමට කටයුතු කරනු ඇත.එසේ වුවද සීමිත පදනම මත බඳවා ගැනීම යටතේ බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරන ලද ප්‍රමාණවත් අභ්‍යන්තර අයදුම්කරුවන් පිරිසක් අයදුම්පත් ඉදිරිපත් කර නැති විට, 100% ක් විවෘත පදනම මත බඳවා ගැනීම යටතේ බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

3. වැටුප් කේත අංකය : MT-01-2016

වැටුප් පරිමාණය : රු.29,840 – 10 X 300 – 11 X 350 – 10 X 560 – 10 X 660 – 48,890

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව)

( පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත I වැනි කාර්යක්ෂමතා කඩඉම සහ II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර III තුන්වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු අතර, 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.)

4. **සුදුසුකම් : ඉල්ලුම් පත් කැඳවීමේ අවසාන දිනය වන විට,**

I. **අධ්‍යාපන සුදුසුකම්** : භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

II. **වෘත්තීය සුදුසුකම්** : එක් එක් ක්ෂේත්‍රයෙහි කාර්යභාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

ක්ෂේත්‍ර යන්නට රජයේ චිත්‍රපට අංශයේ නිශ්චල ඡායාරූපකරණය, වීඩියෝ කැමරාකරණය, සංස්කරණය, ශබ්ද කාර්මික තාක්ෂණය, මෝටර් වාහන නඩත්තුව, විදුලි උපකරණ නඩත්තුව හා ගොඩනැගිලි නඩත්තුව ඇතුළත් වේ.

III. **පළපුරුද්ද** : රජයේ චිත්‍රපට අංශයේ නිශ්චල ඡායාරූප අංශයේ/ නිෂ්පාදන අංශයේ/ නඩත්තු අංශයේ හෝ වෙනත් කාර්මික කාර්යයන් සම්බන්ධයෙන් වන අංශයක අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

IV. **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

V. **වෙනත් :** තනතුරට අදාළව මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

5. **පත්වීම ක්‍රියාත්මක වන දිනය :**

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

6. වයස : අදාළ නොවේ.

7. **ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

a) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර , ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක,ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය . ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතුය . ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් . අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ . ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත් නිවේදනයේ දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලවද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ . එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

b) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත 2017 මාර්තු 03 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය.

ඉල්ලුම්පත් බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව **රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක තනතුර සඳහා සීමිත පදනමින් බඳවා ගැනීම** යන වචන සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

c) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ . ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

8. **සේවා කොන්දේසි -** තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද 2013.05.31 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක තනතුරට පත් කරනු ලැබේ.

9. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය ඇත.

10. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් , එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු /ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

ආචාර්ය රංග කලන්සූරිය

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කිරුළපන මාවත
කොළඹ 05

2017 ජනවාරි මස 13 වැනි දිනය

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ -3 සේවා ගණයේ**

**(MT -01-2016) තාක්ෂණ සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ වෘත්තීය පරීක්ෂණය - 2017**

ඉල්ලුම් කරන අංශය :

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 01

දෙමළ - 02

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : Mr./Mrs. /Miss.: ________________________
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා: Mr./Mrs. /Miss. SILVA A. B

1.2 සම්පූර්ණ නම: ______________________________________

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

1.3 සම්පූර්ණ නම: ____________________

(සිංහලෙන්/දෙමළෙන්)

2. 2.1 ලිපිනය ( පෞද්ගලික) : ____________________

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.2 ලිපිනය ( පෞද්ගලික) :____________________

( සිංහලෙන්/දෙමළෙන්)

3. 3.1 උපන් දිනය: ____________________

වර්ෂය | | | | |    මාසය | | |    දිනය | | |

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස : ______________________

අවු: | | |    මාස: | | |    දින: | | |

04. ජාතික හැඳුනුම්පත් අංකය : ____________________

05. ස්ත්‍රී/ පුරුෂභාවය : ____________________

06. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය :____________________ විභාග අංකය :________

| විෂය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

(ආ) වෘත්තීය සුදුසුකම් :

(ඇ) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද: ______________________

08. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි . මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇතොත් , විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනිමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය : ______________________ ______________________

අයදුම්කරුගේ අත්සන

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු / ඇය මා ඉදිරිපිටදී ............................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

...........................................................

අධ්‍යක්ෂ (රජයේ චිත්‍රපට අංශය) / හෝ බලයලත් නිලධාරියා

සම්පූර්ණ නම :

තනතුර :

නිල මුද්‍රාව :